බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභා,
චක්‍ර ලේඛ අංක:09/94.

මගේ අංකය:බ/ස.සේ.කො/ච,
සමුපකාර සේවක කොමිෂන් සභාව
(බස්නාහිර පළාත),
මහ ලේකම් කාර්යාලය - මාලිගාව
කොළඹ - 10.
1994 ඔක්තෝබර් මස දින.

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිතිවල,
සභාපතිවරුන් වෙත.

1971 උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ සමුපකාර සමිතිවල තනතුරු සඳහා අනුයුක්ත වූ, උපාධිධාරීන් ට පරිබාහිරව සමුපකාර සමිතිවල සේවය කරන උපාධිකාරී නිලධාරීන්.

ඉහත කරුණ සම්බන්ධයෙන් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති, අංක: 180/90 හා 1990.06.27 දින දරණ චක්‍ර ලේඛ ද, බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අංක:08/1994 හා 1994.07.11 දිනැති චක්‍රලේඛය ද 1994.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරනු ලබන අතර, එදින සිට මෙහි පහත සඳහන් විධිවිධාන බල පැවැත්වේ.

(I). 1971 උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ සමුපකාර සමිතිවලට බඳවාගෙන ඇති උපාධිධාරීන්ට රු:49200-15x1560-72600 යන වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ වැටුප ගෙවිය යුතුය.

(II). උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමයට පරිබාහිරව 1971-1977 අතර කාලයේ දී පත්වීම් ලබා ඇති අභ්‍යාසලාභී නො වන උපාධිධාරීන් ට ද පෞද්ගලික වන සේ රුපියල් 45120-10x1200-57120 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ වැටුප ගෙවිය යුතුය.

(III) ඉහත සඳහන් කිසියම් උපාධිධාරී නිලධාරියකු දැනටමත් අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක තලයේ වැටුපට වඩා වැඩි වැටුප් ලබමින් සිටී නම්, එවැනි අයට නව වැටුප් පරිමාණයේ ආසන්නතම වැඩි වැටුප් තලයේ වැටුප ගෙවිය යුතුය.

(IV) මෙහි (I),(II), හා (III) යන උප ඡේදවල සඳහන් කරුණු කිසියම් උපාධිධාරී සේවකයෙකු ට වාසිවන අන්දමට දැනටමත් ඔහුට පමණක් වන සේ කිසියම් වැටුපක් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත්නම්, එම වැටුප ඉදිරියටත් ගෙවිය යුතුය.

කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි,
..............................
(ඒ.එල්.එස්.මල්වැන්න)
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
(බස්නාහිර පළාත).

පිටපත්.-

1. බ.ප., ආහාර, කෘෂිකර්ම හා සමුපකාර අමාත්‍යාංශයේ ලේකම්,
2. ස.සං.කො./රෙ/(බ.ප.)
3. ආහාර, සමුපකාර හා නිවාස ලේකම්.
4. ස.සං.කො.රෙ.
5. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව.
6. ප්‍රාදේශීය ලේකම්

කු.ම/-